**ශීර්ෂය 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්වාගණනය කළ මතය**

---

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක **271/**2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

--------------------------------------

### 1.6.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ).** | 2019 දෙසැම්බර් 03 දිනැති අංක **271/**2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් යටතේ අත්තිකාරම් ලැබීම් ලෙස දැක්විය යුතු රු. 4,806,474 ක වටිනාකම ඇතුළත් කර නොතිබුණි. | අත්තිකාරම් ලැබීම් ලෙස දැක්විය යුතු රු. 4,806,474 ක වටිනාකම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයෙහි ආදායම් නොවන ලැබීම් යටතේ වෙන් වෙන්ව ඇතුළත් කළ යුතු වේ. | පිළිගනිමි. මෙම මුළු මුදල මුළු ආදායම් නොවන ලැබීම් යටතේ සඳහන් කර ඇත. ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් සඳහන් කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| **(ආ).** | සමාලෝචිත වර්ෂය තුළ ලැබී තිබූ එකතුව රු.403,610 ක වෙනත් ලැබීම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ ඇතුළත් කර නොතිබුණි. | භාණ්ඩාගාර අග්‍රිම හැර වර්ෂය තුල ආයතනයට ලැබුණු වෙනත් ලැබීම්, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ලැබීම් යටතේ ඇතුළත් කළයුතු වේ. | පිළිගනිමි. මෙම මුළු මුදල මුළු ආදායම් නොවන ලැබීම් යටතේ සඳහන් කර ඇත. ඉදිරියේදී වෙන් වෙන් වශයෙන් සඳහන් කරනු ලැබේ. |

### 1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ). | කාර්යාලය සතු මුළු ස්ථාවර වත්කම්වල වර්ෂයේ ආරම්භක ශේෂ, වර්ෂය තුළ මිලදී ගැනීම්, අපහරණයන් සහ අවසාන ශේෂවල එකතුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඒසීඒ-6 ආකෘතිය යටතේ වූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ, කේත අංක 611 ඉදිරියෙන් දක්වා නොතිබුණි. | කේත අංක 611 ඉදිරියෙන් ආරම්භක ශේෂ, වර්ෂය තුළ මිලදී ගැනීම්, අපහරණයන් සහ අවසාන ශේෂවල එකතුව ඇතුළත් කළයුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය නිවැරදි වේ. භාණ්ඩාගාර ප්‍රකාශයන්හි යම් යම් වෙනස්කම් ඇත. 2020 වසර තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ). | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඒසීඒ - 6 ආකෘතියේ දක්වා තිබූ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව 2018 දෙසැම්බර් 31 දිනට වෙනත් යන්ත්‍ර හා යන්ත්‍ර උපකරණ වල අගය රු. 6,355,556 ක් වුවද, 2019 ජනවාරි 01 දිනට ඊට අනුරූප අගය රු.6,632,337 ලෙස දක්වා තිබීම හේතුවෙන් රු.276,781 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වූ අගයයන් 2019 ජනවාරි 01 දින අගයන්ට සමාන විය යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය නිවැරදි වේ. භාණ්ඩාගාර ප්‍රකාශයන්හි යම් යම් වෙනස්කම් ඇත. 2020 වසර තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ). | මූල්‍ය ප්‍රකාශනවල කේත අංක 61122 - වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ තිබිය යුතු වත්කම් කාණ්ඩ 05 ක ආරම්භක ශේෂයන් වර්ගීකරණය කොට දක්වා නොතිබුණි.තවද, කේත අංක 61122 යටතේ වූ ආරම්භක ශේෂය සහ ඒ යටතේ CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාවෙහි දැක්වෙන ආරම්භක ශේෂය අතර රු.257,443 ක වෙනසක් නිරීක්ෂණය විය. එමෙන්ම CIGAS වැඩසටහන අනුව සහ රාජ්‍ය ගිණුම් | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය, CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාවේ කේත අංකවල සඳහන් අගයන් එකිනෙකට සමාන විය යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය නිවැරදි වේ. භාණ්ඩාගාර ප්‍රකාශයන්හි යම් යම් වෙනස්කම් ඇත. 2020 වසර තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව අනුව කේත අංක 61122 යටතේ වාර්තා වී තිබුණු වත්කම් කාණ්ඩ 05 හි ආරම්භක ශේෂයන්ද එකිනෙක සමාන නොවුණි. | | |
| (ඇ). | මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ-6 ආකෘතිය අනුව කේත අංක 6112201 යටතේ කාර්යාල උපකරණ මිලදී ගැනීම් රු.650,209 ක් වුවද, CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාවෙහි එය රු.4,350 ක් විය. තවද, සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ වත්කම් වාර්තාව අනුව එම වටිනාකම රු.1,868 ක් විය. රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාවෙහි පමණක් කේත අංක 6112204 යටතේ සන්නිවේදන උපකරණ මිලදී ගැනීම් රු.38,920 ක් වශයෙන් වාර්තා වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ-6 ආකෘතිය, CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව යනාදියෙහි කේත අංකවල සඳහන් අගයන් එකිනෙකට සමාන විය යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය නිවැරදි වේ. භාණ්ඩාගාර ප්‍රකාශයන්හි යම් යම් වෙනස්කම් ඇත. 2020 වසර තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ). | මූල්‍ය නොවන වත්කම් වලට අදාල ඒසීඒ-6 ආකෘතියේ සඳහන් සහ CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාවෙහි සමාලෝචිත වර්ෂය තුළ අපහරණයක් කිසිවක් වාර්තා වී නොතිබුණි. නමුත්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාවෙහි වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ අපහරණයන්වල එකතුව රු.295,445 ක් වශයෙන් වාර්තා වී තිබුණි. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ වූ ඒසීඒ-6 ආකෘතිය, CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව අනුව අපහරණ අගයන් එකිනෙකටසමාන විය යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය නිවැරදි වේ. භාණ්ඩාගාර ප්‍රකාශයන්හි යම් යම් වෙනස්කම් ඇත. 2020 වසර තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඊ). | මූල්‍ය ප්‍රකාශයෙහි කේත අංක 61122 - වෙනත් යන්ත්‍ර හා උපකරණ යටතේ තිබිය යුතු වත්කම් කාණ්ඩ 05 ක අවසාන ශේෂයන් වර්ගීකරණය කොට දක්වා නොතිබුණි.තවද, කේත අංක 61122 යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අවසාන ශේෂය, CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාවෙහි අවසාන ශේෂය සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව අනුව අවසාන ශේෂය පිළිවෙලින් රු.6,889,780, රු.6,894,130 ක් සහ රු.6,377,681 ක් වශයෙන් වාර්තා වී තිබුණි. එම වටිනාකම් අතර පැවති වෙනසකම්වලට හේතු විගණනයේදී සොයා ගත නොහැකි විය. එසේම CIGAS වැඩසටහන අනුව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව අනුව කේත අංක 61122 යටතේ වාර්තා වී තිබුණු | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඒසීඒ-6 ආකෘතිය, CIGAS වැඩසටහන අනුව වත්කම් වාර්තාව සහ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු වත්කම් වාර්තාව අනුව කේත අංකවල සඳහන් අගයන් එකිනෙකට සමාන විය යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනය නිවැරදි වේ. භාණ්ඩාගාර ප්‍රකාශයන්හි යම් යම් වෙනස්කම් ඇත. 2020 වසර තුලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | වත්කම් කාණ්ඩ 05 හි අවසාන ශේෂයන්ද එකිනෙක සමාන නොවුණි. | | |
| (ඌ) | 2019 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ 2019 සහ 2018 වර්ෂයන්ට අදාළ ශුද්ධ වත්කම්වල එකතුව පිළිවෙලින් රු.7,178,547 කින් හා රු.5,169,754 කින් අඩුවෙන් පෙන්වා තිබුණි. | මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශයේ එකතුන් නිවැරදිව දැක්විය යුතු වේ. | මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය නිවැරදි වේ. එකතුව නිවැරදි විය යුතුය. |

**1.6.3 අග්‍රිම ශේෂය**

-------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව 18-01-01-1003 වැය විෂයය සඳහා වෙනත් දෙපාර්තමේන්තු මඟින් රු.47,480 ක වියදමක් දරා තිබුණු නමුත්, එම මුදල ගැලපුම් ගිණුමක් මඟින් සටහන් නොකර, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි සහනාධාර ප්‍රධාන හා මාරුකිරීම් යටතේ අඩු කර දක්වා තිබුණි. එම හේතුවෙන් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයෙහි පුනරාවර්තන වියදම්, මුළු වියදම හා අග්‍රිම ශේෂය රු.47,480 කින් අඩුවෙන් දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 208 ප්‍රකාරව වෙනත් දෙපාර්තමේන්තු මඟින් කරන වියදම් නිවැරදිව ගිණුම් ගත කල යුතු වේ. | පිළිගනිමි. ගැලපුම් ගිණුමක් මගින් සටහන් කිරීම අතපසු වී ඇත. එහෙත් මූල්‍ය ප්‍රකාශනයේ ගිණුම් නිවැරදිව සකසා ඇත. |

**1.6.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | | |
| (i). | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009, 2009 ජුනි 17 දිනැති අංක 09/2009(I) සහ 2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන චක්‍රලේඛ | කාර්යාලයේ නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම සටහන් කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍රයක් භාවිතා කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළ යුතු වේ. | කාර්යාල වේලාවෙන් බැහැරවද, සතිඅන්තයේ සහ නිවාඩු දිනවලද නියමිත කාර්යයන් කිරීමට සිදුවන නිසාත් |

| | | | | |
|---|---|---|---|---|
| | | | | පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට අයත් නොවන නිසා පාර්ලිමේන්තුවේ භාවිතා කරන යන්ත්‍රය භාවිතා කල නොහැකි නිසාත් පැමිණීමේ ලේඛණය නියමිත වේලාවේදී වසා දමා විධිමත් පරිදි කටයුතු කරන බව දන්වමි.එම නිසා චක්‍රලේඛ ක්‍රියාත්මක කිරීමට අපහසු බව දන්වමි. |
| (ii). | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛයේ 6 ඡේදය | නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර මගින් සනාථ කළ යුතු වුවත්, එසේ කිරීමකින් තොරව කාර්යාලය විසින් පැමිණීමේ දීමනාව හා ඉතිරිකර ගත් නිවාඩු සඳහා රු.2,554,512 ක දීමනා ගෙවා තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | ඉහත ඡේදයේ කරුණු පදනම් කරගෙන පැමිණීමේ දීමනාව හා ඉතිරිකර ගත් නිවාඩු සඳහා දීමනාව ගෙවා ඇත. |
| **(ආ).** | 2014 ජනවාරි 01 දිනැති අංක 1/2014 දරන ජාතික අයවැය චක්‍රලේඛය | කාර්යාලයේ නිලධාරීන්ගේ පුහුණු හා හැකියා වර්ධනයට අදාල රු. 2,997,724 ක වියදම් 2401 වැය විෂයය යටතේ ගිණුම් ගත කළ යුතු වුවද, අදාළ වියදම් වැරදි සහගත ලෙස විෂයය 1102 විදේශ ගමන් වියදම් යටතේ ගිණුම් ගත කර තිබුණි. | නිවැරදි වැය විෂයය යටතේ ගිණුම් ගත කළ යුතු වේ. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

**(ඇ).** **රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

| | | | |
|---|---|---|---|
| 2016 පෙබරවාරි 16 දිනැති අංක 431(1) දරන චක්‍රලේඛය | යානාපත්‍ර මිලදී ගැනීමේදී, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතු වුවද, කාර්යාලය විසින් එම උපදෙස්වලින් බැහැරව කටයුතු කරමින්, යානාපත්‍ර මිලදී ගැනීම සඳහා රු.262,500 ක මුදල් වැය කර තිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි පියවරයන් අනුව කටයුතු කිරීම සඳහා නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇත. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ). | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය සටහන (iii) හි විධි විධාන ප්‍රකාරව දක්වා තිබුණු රු.269,777 ක බැරකම්, භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශයෙහි දක්වා නොතිබියදී 2020 වර්ෂයේදී නිරවුල් කර තිබුණි. | බැදීම් හා බැරකම් ප්‍රකාශයේ දක්වා ඇති වටිනාකම භාණ්ඩාගාරය විසින් එක් එක් වියදම් ශීර්ෂවලට අදාලව නිකුත් කරනු ලබන බැදීම් හා බැරකම් ප්‍රකාශය සමඟ එකඟ විය යුතු අතර චක්‍ර ලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී නිවැරදිව සටහන් කරනු ඇත. |
| (ආ). | 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ සටහන (iv) හි රු.118,587 ක බැරකම් දක්වා නොතිබුණි. | නිවැරදිව බැරකම් සඳහන් කළ යුතුය. | ඉදිරියේදී නිවැරදිව සටහන් කරනු ඇත. |

3. **මානව සම්පත් කළමනාකරණය**

සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අනුමත සේවක සංඛ්‍යාව 44 ක් හා තත්‍ය සේවක සංඛ්‍යාව 41 ක් වූ බැවින් පුරප්පාඩු 03 ක් පැවතුණි.